වක්‍රලේඛ අංක : 13/2017

සමුපකාර සේවක කොමිෂන් සභාව (බ:ප:),
අංක 109 , හතර වන මහල,
මහ වීදිය,
බත්තරමුල්ල.
2017. 07/28

බස්නාහිර පළාතේ සියළුම විවිධ සේවා සමුපකාර සමිති,
දිස්ත්‍රික් ග්‍රාමීය බැංකු සංගම්, සණස සමිති, දිස්ත්‍රික් සමුපකාර මණ්ඩල සහ
අනෙකුත් සියලුම ලියාපදිංචි සමුපකාර සමිති සභාපතිවරුන් වෙත,

**<u>ප්‍රසූති නිවාඩු</u>**

ශීර්ෂගත කාරණයට අදාලව නිකුත් කරන ලද 7/2004 වක්‍රලේඛයේ 2:7:8: වගන්ති වෙනුවට පහත සඳහන් වගන්ති ආදේශ කිරීම බස්නාහිර පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාව විසින් අනුමත කර ඇති බව කොමිෂන් සභා නියමය පරිදි මෙයින් දැනුම් දෙමි.

2)

**2:7:8:**

7/2004 වක්‍රලේඛයේ 2:7:1: උප වගන්තිය යටතේ අනුමත කරන ලද වැටුප් සහිත ප්‍රසූති නිවාඩු අවසන් වීමෙන් පසුව සේවිකාව විසින් ඉල්ලීමක් කරන්නේ නම්, දරුවා රැකබලා ගැනීම වෙනුවෙන් වැටුප් රහිත දින 84 ක නිවාඩුවක් ලබාදිය යුතුය. මෙම කාලය තුළ යෙදෙන වෙළඳ නිවාඩු , සති අන්ත නිවාඩු යනාදිය එම වැටුප් රහිත ප්‍රසූති නිවාඩු කාල සීමාවට ඇතුළත් වේ.

**2:7:9**

තවද, දරුවාගේ හෝ මව ගේ විශේෂ රෝගී තත්ත්වයක් හේතුවෙන් තවදුරටත් නිවාඩු අවශ්‍ය බව රජයේ විශේෂඥ වෛද්‍යවරයෙකු විසින් නිර්දේශ කරනු ලබන්නේ නම්, එම නිර්දේශ කරනු ලබන කාල සීමාව සඳහා දින 84ක උපරිමයට යටත්ව තවදුරටත් වැටුප් රහිත නිවාඩු ලබා දිය යුතුය. එම කාලය තුළ යෙදෙන වෙළඳ නිවාඩු , සති අන්ත නිවාඩු යනාදිය එම වැටුප් රහිත ප්‍රසූති නිවාඩු කාල සීමාවට ඇතුළත් වේ.

03) 7/2004 වක්‍රලේඛයේ අනෙකුත් කාරණා එලෙසම බල පැවැත්වේ.

එස්.ඒ.එල්.රංගනී,
ලේකම්,
සමුපකාර සේවක කොමිෂන් සභාව,
බස්නාහිර පළාත.

**පිටපත් :**

I. ප්‍රධාන ලේකම්, බස්නාහිර පළාත.
II. ලේකම්, සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය, බස්නාහිර පළාත.
III. සමුපකාර සංවර්ධන කොමසාරිස්/සමිති රෙජිස්ට්‍රාර්, බස්නාහිර පළාත.
IV. සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් (කොළඹ/ ගම්පහ/ කළුතර)
V. අධ්‍යක්ෂ, බස්නාහිර පළාත් සමුපකාර සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය.
VI. ලේකම්, මධ්‍යම රජයේ සමුපකාර සේවක කොමිෂන් සභාව.
VII. සියළුම පළාත් සමුපකාර සේවක කොමිෂන් සභා ලේකම්වරුන්.
VIII. සියළුම වෘත්තීය සමිති සංගම්